**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2018**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර මතය**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (අධිකාරිය) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2020 ජුලි 24 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. තවද, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------------- | ------------------------------ | --------------- |
| **(අ)** | **ශ්‍රී.ල.ගි.ප්‍ර. 16:- දේපල පිරියත හා උපකරණ** | | |
| (i) | ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදිම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.7,476,170 ක් වූ යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, කාර්යාල උපකරණ, ලීබඩු හා සවිකිරීම්, පුස්තකාල පොත්, ගිණුම් මෘදුකාංග සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. | ආයතනය සතු සියලුම වත්කම් විශ්ලේෂණය කොට ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන මෝටර් රථ 03ක, කාර්යාල උපකරණ 22 ක සහ පරිගණක සහ උපාංග 37 ක ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | මෙහි සදහන් වත්කම් නැවත සත්‍යාපනය කොට ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------ | ------------ |
| (අ) | අධිකාරියේ පරිපාලිත සමාගමක් විසින් 2017 වර්ෂයේ නිකුත් කරන ලද කොටස් සහතිකය අනුව එම සමාගමේ ප්‍රකාශිත කොටස් 100න් කොටසක් රු. 10 බැගින් වූ කොටස් 60 ක් අධිකාරිය වෙත නිකුත් කර තිබුණද , එම කොටස් නිකුතුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | සි/ස. බී - එක්ස්ප්‍රස් ආයතනය සමාගම් සංස්ථා පත්‍රයේ කොටස් සම්බන්ධව සදහන් කොට ඇති අතර කොටස් නිකුත් කිරීමක් සිදුකොට නොමැත.නමුත් මේවනවිට කොටස් නිකුත් කිරීමට අවශය කටයුතු සිදුකරමින් පවති. | කොටස් නිකුතුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) | පෙරවැඩුම් සහ තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරදීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු. 46,450,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් අධිකාරිය වෙත ලබා දී තිබුණි. එම මුදල අධිකාරිය විසින් ආදායමක් වශයෙන් හඳුනාගෙන තිබූ අතර ඒ සඳහා කරන ලද වියදම අධිකාරියේ ජංගම වත්කම් යටතේ පරිපාලිත සමාගමේ ආයෝජනයක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අතිරික්තය සහ ජංගම වත්කම් රු. 46,450,000 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | සි/ස. බී - එක්ස්ප්‍රස් ආයතනය පිහිටුවීම සදහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබුනු අතර එම සියළුම ලැබීම් ආයතනය සඳහාම යොදන ලද අතර එම මුදල මූල්‍ය ප්‍රකාශනවල ආයෝජනයක් ලෙස පෙන්වා ඇත. | පරිපාලිත සමාගමක ගොඩනැගිලි ඉදිකිරීම් හා වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ලද ප්‍රතිපාදන අධිකාරියේ ආදායමක් වශයෙන් හඳුනා නොගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු.3,645,633 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,372,346 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,726,713 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂය තුළ වෙනත් අදායම් රු. 22,165,367කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 අගෝස්තු 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ සිට නියමිත දිනට අවසාන ගිණුම් විගණනය සඳහා ලබාදීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |